මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை.

The Secretariat, Colombo 01.
Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700

ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823

වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.:

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2024.08.22

**මාධ්‍ය නිවේදනය**

**සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ (හිල්ටන් හෝටල් සමාගම) අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් කෙරෙන නොමඟ යවන සුළු මාධ්‍ය වාර්තා**

සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ (හිල්ටන් හෝටල් සමාගම) අයිතිය බැහැර කිරීමට අදාළව ජාතික පුවත්පත් කිහිපයක පළවී ඇති සහ සමාජ මාධ්‍යයන් තුළ සංසරණය වන ඇතැම් නොමග යවන සුළු මාධ්‍ය වාර්තා සම්බන්ධයෙනි.

සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමෙහි ශ්‍රී ලංකා රජය සතු කොටස් අයිතිය බැහැර කිරීම අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අයිතිය බැහැර කිරීමේ මාර්ගෝපදේශයට අනුකූලව සිදු කරනු ලබයි.

(https://www.treasury.gov.lk/api/file/a82a1a9c-bb82-4b86-ac48-6716c01fe35e)

මෙම මාර්ගෝපදේශය තුලින් වඩා වැඩි විනිවිදභාවයක් සහ වගවීමක් සහතික කරන අතර, මෙම ක්‍රියාවලියේ විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් ආයෝජකයින්ට තහවුරුවක් ලබාදේ. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය (SOERU) විසින් අභිලාෂ ප්‍රකාශයන්ගේ (EOI) ප්‍රගතිය සහ ආයෝජකයින් මෙම කටයුතු සඳහා සම්බන්ධ වීම ඇතුළුව මෙම ක්‍රියාවලිය පිළිබඳව අඛණ්ඩ යාවත්කාලීන කිරීමක් සිදු කරනු ලබයි.

(https://www.treasury.gov.lk/web/sru-entities-to-be-divested/section/hotel-developers-lanka).

එබැවින්, සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමෙහි අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් නිසි ක්‍රමවේදය අනුගමනය කර ඇති බව මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් අවධාරණය කරනු ලැබේ.

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය විසින් 2024 වර්ෂයේ ජූලි 26 වැනි දින මේ සම්බන්ධයෙන් වැඩිදුර තාක්ෂණික පැහැදිලි කිරීම් ලබා දෙමින් ප්‍රකාශයක් නිකුත් කර ඇත.

මෙම ප්‍රකාශයේ ඇතුළත් ඇතැම් විශේෂ කරුණු පහත පරිදි නැවත ඉදිරිපත් කෙරේ;

සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් මෑතකාලීන පුවත්පත් ලිපි සහ සමාජ මාධ්‍යයන්හි අන්තර්ගත වන්නේ:

1. සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ (කොළඹ හිල්ටන්හි හිමිකාරීත්වය දරන සමාගම) අයිතිය බැහැර කිරීම තුළ අක්කර 7ක ඉඩමක් ඇතුළත් බව:

   මෙය සාවද්‍ය ප්‍රකාශයකි.

   මෙම ගනුදෙනුවට සම්බන්ධ ඉඩම අක්කර 4.61ක් වන අතර, සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමට වර්ෂ 2111 දක්වා බදු පදනම මත භාවිතයට ලබාදී ඇත. එසේම, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියට යටත්ව තවත් අක්කර 1.875ක ඉඩමක් රුපියල් බිලියන 4.4ක මිලකට සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම වෙත වර්ෂ 2111 දක්වා බදු පදනම මත ලබා දෙනු ඇත (සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම සඳහා වන මිලට අමතරව). හෝටලයේ අවන්හල් දෙකක්, එහි පිහිනුම් තටාකය, කායවර්ධන මධ්‍යස්ථානය සහ වාහන නැවැත්වීමේ පහසුකම්වලින් කොටසක් මෙම ඉඩමෙහි පිහිටා ඇත. 2022 වර්ෂයේ මාර්තු 21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම් මෙම ගනුදෙනුව සිදුව ඇති අතර, ඒ අනුව සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අයිතිය බැහැර කරන අවස්ථාවේදී මෙම ඉඩම ඉහත මිල ප්‍රමාණයන් මත වෙන්කර දීමට තීරණය කර ඇත.

2. කොළඹ හිල්ටන් හෝටලයෙහි මෑත කාලීනව සිදුකරන ලද නවීකරණයන් හේතුවෙන් තරු 7 වර්ගීකරණයක් ලබා ඇති බව:

   මෙය සාවද්‍ය ප්‍රකාශයකි.

   කොළඹ හිල්ටන් හෝටලය තරු 5 වර්ගීකරණයේ පැවති අතර, තවදුරටත් තරු 5 වර්ගීකරණයේම පවතී.

3. 2023 වර්ෂයේදී රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමෙහි තක්සේරු වටිනාකම ඇ.ඩො. මිලියන 124ක් ලෙස තක්සේරු කර ඇති අතර, එය 2024 වර්ෂයේ ජූලි මාසයේදී නිකුත් කරන ලද තක්සේරු වටිනාකමට වඩා ඉහළ අගයක් ගන්නා බව:

   මෙය සාවද්‍ය ප්‍රකාශයකි.

   රජයේ ප්‍රධාන තක්සේරුකරු විසින් තහවුරු කරන ලද පරිදි, සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමෙහි පෙර තක්සේරුව 2020 වර්ෂයේ නොවැම්බර් 19 දිනැතිව සිදු කරන ලදී. එම තක්සේරුව 2024 වර්ෂයේ ජූලි මාසයේදී නිකුත් කරන ලද තක්සේරුවට වඩා අඩු අගයකි. එසේම, තක්සේරුව ඇමරිකානු ඩොලර් වලින් නොව ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත.

4. සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම සඳහා කරන ලද මූල්‍ය යෝජනාව පිළිගෙන ඇති බව:

   මෙය සාවද්‍ය ප්‍රකාශයකි.

   මූල්‍ය යෝජනාවක් ලැබී ඇති නමුත් සාකච්ඡා තවදුරටත් අවසන් කර නොමැති අතර, මිල පිළිබඳ අවසන් තීරණයකට එළඹ නොමැත.

5. සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් දේශපාලන මැදිහත්වීම් ඇති බව:

   මෙය සාවද්‍ය ප්‍රකාශයකි.

   සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් විනිවිදභාවයෙන් යුතු මිල අනාවරණය වන ක්‍රියාවලියක් අනුගමනය කර ඇත. තවද, කිසිදු අදියරකදී දේශපාලඥයෙකු සහ / හෝ රාජ්‍ය නිලධාරියෙකු සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගම හෝ වෙනත් රජය සතු ව්‍යවසායයක අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් වන කටයුතු වලදී රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයෙහි වැඩ කටයුතුවලට බලපෑම් කිරීමට හෝ මැදිහත් වීමට උත්සාහ දරා නොමැත.

රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයෙන් ස්වාධීන වන අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද කමිටු දෙකක් මඟින් අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් වන මූල්‍ය යෝජනා සහ ලංසු පිළිබඳව ඇගයීම් සිදුකරනු ලබන බව රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයෙහි ප්‍රකාශය මඟින් නැවත අවධාරණය කරනු ලබයි. විශේෂ ව්‍යාපෘති කමිටුව සහ අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ සාකච්ඡා කමිටුව, එම කමිටු දෙක වේ. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය ලෙස ක්‍රියා කරන අතර, කමිටු දෙකෙහි කටයුතු සඳහා පහසුකම් සැලසීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයේ දක්වා ඇති මෙම වගකීම් බෙදා වෙන් කිරීමේ සහ අනෙකුත් විශේෂාංගයන් මඟින් අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය සහ විශ්වසනීයත්වය සහතික කරනු ලබයි. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ඒකකයේ සහ ඉහත කමිටු දෙකෙහි බලතල සහ සංයුතිය, අයිතිය බැහැර කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශයේ සවිස්තරව සඳහන් කර ඇත.

ඒ අනුව, අයිතිය බැහැර කිරීමේ ක්‍රියාවලියේදී වෘත්තීයමය ප්‍රවේශයක් අනුගමනය කර ඇති බව ශ්‍රී ලංකා රජය විසින් නැවත වරක් අවධාරණය කරන අතර, සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමෙහි තක්සේරු කිරීම සම්බන්ධයෙන් එල්ල වන චෝදනා සාවද්‍ය බවත් එය හිතාමතාම පොදු මහජනතාව නොමඟ යැවීමේ අරමුණින් සිදු කරන ලද බවත් නැවත තහවුරු කරනු ලැබේ. තවද, සීමාසහිත හොටෙල් ඩිවලපර්ස් (ලංකා) සමාගමේ අයිතිය බැහැර කිරීමේ කටයුතු ජනාධිපතිවරණය අවසන් වනතුරු සිදු නොකරන බවද මෙමඟින් දැනුම් දෙනු ලැබේ.